ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2020 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

---

**හැඳින්වීම:**

මෙම ප්‍රශ්න පත්‍රය ව්‍යාපාරික පරිසරය විෂය නිර්දේශයේ බොහෝ කොටස් ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. එමෙන්ම මෙහිදී මූලික වශයෙන් දැනුම පරීක්ෂා කර ඇත. විභාග අයදුම්කරුවන් මෙවර ඉතාම ඉහළ ලකුණු ලබා වැඩි දෙනෙකු සමත් වී තිබූ අතර, ඉතාම සීමිත පිරිසක් අසාර්ථක උත්තර සපයා අසමත් වී තිබුණි.

පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ:

## A - කොටස

### ප්‍රශ්න අංක 01

1.19 මෙම ප්‍රශ්නයට උත්තර සාර්ථකව සැපයීමට බොහෝ අයදුම්කරුවන් අසමත් වී ඇති බවත් අයදුම්කරුවන් තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳව මනා අවබෝධයක් නොතිබූ බවත් දක්නට ලැබුණි.

1.20 මෙම ප්‍රශ්නයටද බහුතර අයදුම්කරුවන් සංඛ්‍යාවකට සාර්ථකව උත්තර සැපයීමට අපොහොසත් වී තිබූ අතර, ආචාරධර්ම සංග්‍රහයන් පිළිබඳව මනා අවබෝධයක් නොතිබූ බවද පෙන්වා දෙයි.

මෙම ප්‍රශ්නය සමස්තයක් ලෙස ගත්කල විභාග අයදුම්කරුවන්ගේ පැත්තෙන් ඉතාම සාර්ථක තත්ත්වයක පැවතුණි. මෙම ප්‍රශ්නයේ මුළු ලකුණු ප්‍රමාණය වූ ලකුණු 40 ම ලබාගත් අය සැලකිය යුතු පිරිසක්ද, සමස්ත විභාග අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ලකුණු 26 - 36 ත් අතර සිටි බවත් සියලුම විභාග අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා ඇති බවත් දක්නට ලැබුණි.

## B - කොටස

### ප්‍රශ්න අංක 02

**(a) කොටස:**

මෙම කොටසට සියලුම අයදුම්කරුවන් උත්තර සපයා තිබුණි. නමුත් අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් කේවල ස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ පැහැදිලි කර නොතිබූ අතර, කරුණු 4 ක් වශයෙන් පමණක් සඳහන් කර තිබුණි.

**(b) කොටස:**

මෙම කොටසට උත්තර සැපයීමේ යම් පසුබෑමක් දක්නට තිබුණි. ඇතැම් අයදුම්කරුවන් සන්නිවේදනය යන්න කුමක්දැයි වටහා නොගත් බවක් දක්නට ලැබුණි.

**(c) කොටස:**

රක්ෂණය කල හැකි අවදානම් පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙම කොටසට උත්තර සැපයීම ඉතාමත් සාර්ථක මට්ටමක පැවති බව දක්නට ලැබුණි.

සමස්තයක් ලෙස ගත්කල මෙම ප්‍රශ්නයට උත්තර සැපයීම සාර්ථක මට්ටමක පැවතුණි.

## ප්‍රශ්න අංක **03**

**(a) කොටස:**

මෙම කොටසට උත්තර සැපයීමේදී බොහෝ දෙනෙකු දේශීය වෙළඳාමේ සහ විදේශීය වෙළඳාමේ ලක්ෂණ ලියා ඇති නමුත් පැහැදිලි වෙනස්කම් ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන නොමැති බවත්, විෂය දැනුමක් නොමැතිව සාමාන්‍ය දැනීමෙන් උත්තර ලියා ඇති බවත්, එම නිසා අඩුවෙන් ලකුණු ලබාගත් බවක් දක්නට ලැබුණි.

**(b) කොටස:**

මෙම කොටසට අයදුම්කරුවන් බහුතරයක් නිවැරදි උත්තර ලියා ඇති නමුත් එහිදී විදේශ වෙළඳාමේ ප්‍රතිලාභ 3 ක් සඳහන් කිරීම පමණක් සිදුකර තිබුණද, සැලකිය යුතු පිරිසක් එය පැහැදිලි කිරීමේ අවශ්‍යතාවය තේරුම් නොගෙන ඇති නිසා අදාල සම්පූර්ණ ලකුණු ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

**(c) කොටස:**

දී ඇති සමාගම, සීමාසහිත පොදු සමාගමක් ලෙස සංස්ථාපනය කිරීමෙන් ලැබෙන වාසි දැක්වීම මෙහි අවශ්‍යතාවය විය.  මෙම කොටස සඳහා බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇති බව දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නය සඳහා සමස්තයක් ලෙස ගත්කල අදාල සම්පූර්ණ ලකුණු ලබාගත් අයදුම්කරුවන් ප්‍රමාණවත් නොවන බවත් අඩක් ලකුණු ලබාගත් පිරිස වැඩි බවත් තවද, ඉතා සුළු පිරිසක් අඩු ලකුණු ලබාගෙන තිබූ බව දක්නට ලැබුණි.

## ප්‍රශ්න අංක **04**

**(a) කොටස:**

ව්‍යවසායකයෙකුට අවශ්‍ය කුසලතා පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. කෙසේනමුත්, අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට ඉදිරිපත් වී තිබුණද, ඉතාමත් සාර්ථක උත්තර දක්නට නොලැබුණි. මේ අනුව කුසලතා සඳහන් කර තිබුණද, විස්තර කිරීම්වල පැවති අඩුපාඩු හේතුවෙන් ලකුණු අහිමි විය.

**(b) කොටස:**

ව්‍යවසායකත්වයේ තිබෙන ප්‍රතිලාභ පිළිබඳව විමසා තිබූ මෙම කොටසට අයදුම්කරුවන්ට සාර්ථකව උත්තර සපයා තිබූ බවත්, වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත් බවත් දක්නට ලැබුණි. මුළු ලකුණු ප්‍රමාණය වූ ලකුණු 4 ම වැඩි දෙනෙකු ලබාගත් බවත් දක්නට ලැබුණි.

**(c) කොටස:**

කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් අසාර්ථකවීමට බලපාන සාධක සඳහන් කිරීම මෙහි අවශ්‍යතාවය විය. මෙම කොටසට වැඩිදෙනෙක් සාර්ථකව උත්තර සපයා නොතිබූ අතර, උත්තරවල තේරුම පැහැදිලි නොවන ආකාරයෙන් අයදුම්කරුවන් උත්තර ලියා තිබූ බව දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නය සඳහා සමස්තයක් ලෙස ගත්කල අයදුම්කරුවන් වැඩි දෙනෙකුට, වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට නොහැකි වූ බව දක්නට ලැබුණි.

## ප්‍රශ්න අංක **05**

**(a) කොටස:**

මෙහිදී ගෝලීයකරණයේ අවස්ථා 2 ක් පැහැදිලි කිරීම අවශ්‍යතාවය විය. අයදුම්කරුවන් බහුතරයක් එයට උත්තර ලියා තිබුණද එය නිවැරදිව පැහැදිලි කර නොතිබුණි. මෙම කොටසට උත්තර සැපයීම ඉතා අඩු මට්ටමක තිබූ අතර, බහුතරයක් අයදුම්කරුවන් මෙයට සාමාන්‍ය දැනුමෙන් උත්තර සපයා තිබුණු අතර, උත්තර ලිවීම අසාර්ථක මට්ටමක තිබූ බව දක්නට ලැබුණි.

**(b) කොටස:**

සමාජ වගකීම් ක්ෂේත්‍ර පිළිබඳව විමසා තිබූ මෙම ප්‍රශ්නය අයදුම්කරුවන් ඉතාම අඩුවෙන් අවබෝධ කරගෙන ඇති බවත් මෙම කොටසට උත්තර සැපයීම සතුටුදායක මට්ටමක් පෙන්නුම් නොකරන බවත්, තවත් පිරිසක් නිවැරදි උත්තර සපයා නොමැති බවත් දක්නට ලැබුණි. මෙම ප්‍රශ්නය, මෙම සම්පූර්ණ ප්‍රශ්න පත්‍රය හා සළකා බැලූ කල ඉතාම අඩු ලකුණු ලබාගත් ප්‍රශ්නය ලෙස දැක්විය හැකිය.

**(c) කොටස:**

ආයතනික සමාජ වගකීම ඉටුකිරීම හරහා සංවිධානයකට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව මෙයින් විමසා තිබුණි. මෙම කොටසට අයදුම්කරුවන් වැඩි පිරිසක් සාර්ථක උත්තර ඉදිරිපත් කර ඇති අතර, එම උත්තර සඳහා හොඳින් ලකුණු ලබාගැනීමට ඔවුන් සමත් විය.

මෙම ප්‍රශ්නය සඳහා සමස්තයක් ලෙස ගත්කල උත්තර ලිවීම හා ලකුණු ලබා ගැනීම ඉතා අඩු මට්ටමක පැවතුණි. මෙම ප්‍රශ්නයට බොහොමයක් අයදුම්කරුවන් අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත් බවත් **(a)** සහ **(b)** කොටස්වලට ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගත් බවත් අසා ඇති ප්‍රශ්නවලට අදාලව උත්තර සපයා නොමැති බවත් දක්නට ලැබුණි.

## C - කොටස

## ප්‍රශ්න අංක **06**

**(a) කොටස:**

වගකීම සීමිත සමාගමක වාසි සහ අවාසි පිළිබඳව විමසා තිබුණි. මෙම කොටසට අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සාර්ථකව උත්තර ලියා මුළු ලකුණු ලබාගෙන තිබූ අතර, ඇතැම් අය ප්‍රශ්නය තේරුම් නොගෙන කොටස් හුවමාරුවේ ලැයිස්තුගත පොදු සමාගමකට අදාල වාසි සහ අවාසි සඳහන් කර තිබූ බව දක්නට ලැබුණි.

**(b) කොටස:**

මෙම කොටසට උත්තර සැපයීමේදී අයදුම්කරුවන්ගෙන් බහුතයක් වැරදි උත්තර සපයා තිබූ බව දක්නට ලැබුණි. අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව වටහාගෙන නොමැති බවත් 2007 අංක 07 දරණ සමාගම් පනතට අදාලව සමාගම් සංස්ථාපනය කිරීමට ඉදිරිපත් කළ යුතු ලියවිලි පිළිබඳව දැනුවත් වී නොමැති බවත් තහවුරු විය.

**(c) කොටස:**

ශ.දු.අ.ත. විශ්ලේෂණය සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට පූර්ණ දැනුමක් තිබූ බවට සෑහීමකට පත්විය නොහැකි බවත් උත්තර සැපයූ අයගෙන් ඉතාමත් සුළු පිරිසක් පමණක් මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබූ බවත් දක්නට ලැබුණි. තවද, ඉතාම සීමිත අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නය මගහැර තිබූ බවද පෙනුණි.

**(d) කොටස:**

අදාල ආයතනයට කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු විමසා තිබුණි. මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි. ඒ අනුව සැළකිය යුතු පිරිසක් මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි. මෙම ප්‍රශ්නය නිවැරදිව තේරුම් නොගත් සීමිත පිරිසක් ප්‍රවාහනයේ මූලිකාංග පැහැදිලි කිරීම සිදුකර ඇති බව දක්නට ලැබුණි.

**(e) කොටස:**

මෙහිදී වෙළඳාමේ නව ප්‍රවණතා සඳහන් කිරීම අවශ්‍ය විය. මෙම ප්‍රශ්නයට උත්තර සැපයූ අයදුම්කරුවන්ගෙන් බහුතරය හොඳින් ලකුණු ලබාගෙන තිබූ බවත් දක්නට ලැබුණි. කෙසේවෙතත් අතලොස්සක් වූ පිරිසකට කිසිදු ලකුණක් ලබා ගැනීමට නොහැකි වූ බවත් ඔවුන්ට වෙළඳාමේ නව ප්‍රවණතා පිළිබඳ කිසිදු දැනුමක් නොතිබූ බවක් තහවුරු විය.

මෙම ප්‍රශ්නය සඳහා සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් ලකුණු 15 ට වඩා ලබාගෙන තිබූ බවත් ඉතාමත් සුළු පිරිසක් අඩුවෙන් ලකුණු ලබාගෙන තිබූ බවත් දක්නට ලැබුණි. ඉතාමත් සීමිත පිරිසක් ප්‍රශ්නය මගහැර තිබූ බව නිරීක්ෂණය විය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(10) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(11) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

\- * * * -